**චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 (අදියර II) ව්‍යාපෘතිය - 2016**

-----------------------------------------------------------------------------------------------------------------

චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 (අදියර II) ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ චීන සංවර්ධන බැංකු සංස්ථාව අතර 2014 නොවැම්බර් 24 දින එළඹි අංක 4510201401100000587 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

-------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිත ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, තීරණාත්මක ප්‍රවේශතාවක් සපයන පවතින ජාතික හා ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රවාහන යටිතල පහසුකම් හා සේවාවන්හි ගුණාත්මකභාවය තීරණය කරනු ලබන වැඩිදියුණු කල ප්‍රවේශයන්ගෙන් ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට විවිධ සමාජ හා ආර්ථික ප්‍රතිලාභ සැලසීමයි.ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,590.61 කට සමාන එ.ජ.ඩො.මිලියන 117.67 ක් වන අතර ඉන් රු.මිලියන 13,253 කට සමාන එ.ජ.ඩො.මිලියන 100 ක් සැපයීම සඳහා චීන සංවර්ධන බැංකු සංස්ථාව එකඟ වී තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහාවූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඊ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

2016 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු එකතුව රු.මිලියන 21.05 ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කර නොතිබුණි.

**3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| චීන සංවර්ධන බැංකු සංස්ථාව | 100.00 | 13,253.00 | 2,250.00 | 14.86 | 2,193.97 | 14.86 | 2,193.97 |
| ශ්‍රී ලංකා රජය | 17.66 | 2,337.61 | 350.00 | - | 348.50 | | 371.31 |
| එකතුව | 117.66 | 15,590.61 | 2,600.00 | 14.86 | 2,542.47 | 14.86 | 2,565.28 |

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලික කාර්යමණ්ඩලයේ වගකීම් හඳුනාගැනීමට සහ මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වන සවිස්තරාත්මක මූලික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම ව්‍යාපෘතිය විසින් පිළියෙල කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ථයක් වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය කාර්යක්ෂම ලෙස අධීක්ෂණය කර ඇගයීමට ලක් කිරීමට නොහැකි විය.

**(ආ)** ණය ලබාගැනීමේ නියෝජිත ආයතනයේ එකඟතාවයකින් තොරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජාතික හා ග්‍රාමීය මාර්ග 8 ක ප්‍රතිසංස්කරණ කටයුතු කප්පාදු කර රු.මිලියන 15,151.83 ක ප්‍රතිපාදන මහනුවර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල කිලෝ මීටර් 80.6 ක් වන ජාතික මාර්ග 9 ක් සහ කිලෝ මීටර් 48.25 ක් වන ග්‍රාමීය මාර්ග 11 ක ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මාරු කර තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනට ජාතික මාර්ග හා ග්‍රාමීය මාර්ග පිළිවෙලින් සියයට 2.71 ක් හා සියයට 4.26 ක් පමණක් වූ භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2016 දෙසැම්බර් 31 දිනට මාස 6 කට වැඩි කාලයක් ව්‍යාපෘතියේ ප්‍රධාන කළමනාකරණ තනතුරු වන නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක, ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුරු 2 ක්, ව්‍යාපෘති ගණකාධිකාරී ආදි වූ තනතුරු පුරප්පාඩුව පැවති බව නිරීක්ෂණය විය.

**(ආ)** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ සේවක සංඛ්‍යාව ඉක්මවා නිළධාරීන් දෙදෙනෙකු බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.861,415 ක වැටුප් ගෙවා තිබුණි.

**3.4 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු**

------------------------------

මුදල් රෙගුලාසි අංක 751 හි දැක්වෙන පරිදි යාවත්කාලීන කළ ස්ථාවර වත්කම් ලේඛනයක් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.